සැකසුම - M.P.A ප්‍රදීප් කුමාර    කෑ / දෙහි කිතලංගමුව ක . වි


### 4. 2 ආර්ථිකය

### හැඳින්වීම

- පැරණි ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගොවිතැන , කර්මාන්ත හා වෙළඳාම යන අංශ තුන යටතේ ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය.
- විවිධ වෘත්තීන්වල යෙදුණු පිරිස් ද පැරණි සමාජය තුළ වූහ.
- ගොවිතැන ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් යුක්ත අතර හේන් ගොවිතැන පැරණිම ගොවිතැන් ක්‍රමය විය. වී වගාව හෙවත් මඩ ගොවිතැන දෙවන අංශය වූ අතර රාජ අනුග්‍රහය යටතේ එය ක්‍රියාත්මක විය.
- සත්ව පාලනය ද කෘෂිකර්මාන්තයේ ම එක් අංශයක් වූ අතර ගව පාලනය ඒ තුළ ප්‍රධාන විය.
- වෙළඳාම දේශීය හා විදේශීය වෙළඳාම වශයෙන් දියුණු මට්ටමකින් ක්‍රියාත්මක වූ අතර අන්තර්ජාතික වෙළඳාම තුළ ලංකාවට හිමි වූයේ ප්‍රධාන ස්ථානයකි.
- පැරණි ශ්‍රී ලංකාවේ විවිධ රැකියා සහ වෘත්තීන්වල යෙදුණු පිරිස් ද වූ අතර ගුරුවරු , වෛද්‍යවරු , නීති විශාරදයින් හා විවිධ ශිල්පීන් ඒ අතර වැදගත් වෙයි.

### ක්‍රියාකාරකම

1) හේන් ගොවිතැන හා වී ගොවිතැන පිළිබඳව කෙටි සටහන් දෙකක් ලියන්න.

2) පැරණි ශ්‍රී ලංකාවේ පැවති කර්මාන්ත පිළිබඳව පහත වගුව සම්පූර්ණ කරන්න.

| කර්මාන්තය | ශිල්පීන් හැඳින් වූ නාමය | ඒ පිළිබඳව සඳහන් මූලාශ්‍රය |
|---|---|---|
| | | |
| | | |
| | | |

3) පැරණි ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳාම පිළිබඳ පහත අංශ යටතේ කරුණු සපයන්න.

- වෙළඳ නගර
- වෙළඳ කණ්ඩායම් හා වෙළඳුන් වර්ග
- වෙළඳ නීති වර්ග

4) අතීතයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ පහත වගුව පුරවන්න.

| | |
|---|---|
| වෙළඳ සබඳතා පැවැත්වූ රටවල් | |
| මෙරට සිටි විදේශීය වෙළඳ සංවිධාන | |
| විදේශ වෙළඳාමේ දී වැදගත් වූ වෙළඳ ද්‍රව්‍ය | |
| වැඳගත් වෙළඳ වරායන් | |

5) අතීතයේ මෙරට සිටි විවිධ වෘත්තිකයන් නම් කර ඔවුන් පිළිබඳව සඳහන් ශිලා ලේඛන පිළිබඳව සඳහන් කරන්න.